# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
**காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்**
**LAND COMMISSIONER GENERAL'S DEPARTMENT**

**"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.**
"மிஹிகதமெதுர", காணிச் செயலகம், 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla.


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / MY NO: 4/1/රණවිරු චක්‍රලේඛ | ඔබේ අංකය / உமது இ இல / YOUR NO: | දිනය / திகதி / DATE: 2014.12.01 |

චක්‍රලේඛ අංක 07/2014

සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්,
සියලුම නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරුන් / සහකාර ඉඩම් කොමසාරිස්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්.

**<u>රණවිරු පවුල් සඳහා රජයේ ඉඩම් ලබා දීම.</u>**

ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී මියගිය, ආබාධිත වූ සහ අතුරුදහන් වූ රණවිරු පවුල් පිළිබඳව සියලු ඉඩම් ලබා දීමේ කටයුතු රණවිරු සේවා අධිකාරිය මගිනුත්, දැනටමත් සේවයේ යෙදී සිටින, විශ්‍රාමික හා ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය රණවිරු පවුල් සම්බන්ධ සියලු ඉඩම් ලබා දීමේ කටයුතු සන්නද්ධ හමුදා හා පොලිස් සුභ සාධන අංශය මගිනුත් සිදු කිරීමට තීරණය කරන ලද බව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MOD/PAC/07/RVSA/GEN හා 2014.05.23 දිනැති ලිපිය මගින්ද, පොලිස් සේවයේ නිලධාරීන් සඳහා එම ඉඩම් ලබා දීමේ කටයුතු නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය විසින් සිදු කරන බවට නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MinLO/POL/07/334/14 හා 2014.07.31 දිනැති ලිපිය මගින්ද දන්වා ඇත.

2. මේ අනුව මෙම කණ්ඩායම්වලට ඉඩම් ලබා දීමේදී ලබා ගත යුතු නිර්දේශ ලබා ගැනීම හා අදාල සම්බන්ධීකරණ කටයුතු ඉහත ආකාරයට සිදු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ආර්.පී.ආර්. රාජපක්ෂ,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්:
1. ලේකම් - ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - කාරුණික දැ.ගැ.ස.
2. ලේකම් - රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය - කාරුණික දැ.ගැ.ස.
3. ලේකම් - නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය - කාරුණික දැ.ගැ.ස.
4. ඉඩම් අංශයේ සියලුම නිලධාරීන් - ඉහත තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා


දුරකථනය / தொலைபேசி: 011-2797400 | ෆැක්ස් / பெக்ஸ்: 011-2864051 | වෙබ් ලිපිනය / இணையம்: www.landcommdept.gov.lk | ඊමේල් / ஈ-மெயில்: landcom@landcommdept.gov.lk